**බිස්නස් ලංකා ඒ එන් (පුද්ගලික) සමාගම - 2015**

**-----------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බිස්නස් ලංකා ඒ එන් (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

**--------------------------------**

අඛණ්ඩ ව්‍යාපාර අලාභ, සෘණ කාරක ප්‍රාග්ධනය සහ ණය ගෙවීමේ හැකියාවන්ගේ සෘණ ආන්තිකය යන තත්ත්වයන්ට සමාගම මුහුණ පාමින් සිටියි. තවද, සමාගමේ ප්‍රධාන මෙහෙයුම් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සේවය 2016 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි අවසන් කර තිබුණි. මෙම තත්ත්වයන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පෙන්නුම් කරන අතර එමගින්, අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සමාගම සතු හැකියාව පිළිබඳව ප්‍රබල සැකයක් මතු විය හැකි අතර

එබැවින්, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී සමාගමේ වත්කම් උපලබ්ධි කිරීමේ සහ එහි වගකීම් නිදහස් කරගැනීමේ නොහැකියාවක් පැවතිය හැකිය. එසේම, මෙම කරුණ මූල්‍ය ප්‍රකාශනවල (හා එහි සටහන) හෙළිදරව් කරනු නොලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 අහිතකර මතය

-----------------

අහිතකර මතය සඳහා පදනම යටතේ සාකච්ඡා කරන ලද කරුණු අනුව, මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට බිස්නස් ලංකා ඒ එන් (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ගණකාධිකරණ ප්‍රතිපත්ති

--------------------------------

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ බොල් හා අඩමාන ණය වෙන්කිරීම් ලෙස රු.5,527,010 ක් වෙන්කර තිබුණද, එසේ අනුගමනය කිරීමට හේතු වූ ක්‍රියා මාර්ගය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය බදු පෙර ශුද්ධ අලාභය රු.10,575,658 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය රු.5,549,998 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,025,660 ක පිරිහීමක් දැක්වුණි.

සමාලෝචිත වර්ෂය තුල ආදායමෙහි සැලකිය යුතු අඩුවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

#### 3.2.1 ප්‍රමාණාත්මක ගණකාධිකරණ අනුපාත

--------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල දල ලාභ ආන්තිකය හා ලාභ ඉලක්කය (Mark up) පෙර වර්ෂය හා සැසඳීමේදී සියයට 18 ක් සහ සියයට 51 ක් වශයෙන් අඩු වී තිබුණි. විග්‍රහාත්මක සමාලෝචනයේදී නිරීක්ෂණය වූ සමහර කරුණු පෙර වර්ෂය හා සමඟ සසඳා පහත දැක්වේ.

| | 2015<br>(ප්‍රතිශතයක් ලෙස) | 2014<br>(ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|
| දල ලාභ ආන්තිකය | 29 | 47 |
| ලාභ ඉලක්කය (විකුණුම් පිරිවැය මත දළ ලාභය) | 41 | 92 |
| විකුණුම් මත පරිපාලන පිරිවැය | 77 | 41 |
| විකුණුම් මත විකිණීමේ හා බෙදාහැරීමේ වියදම | 67 | 38 |

### 3.2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ ජංගම වත්කම් හා ජංගම වගකීම් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සෘණ කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් රු.10,418,648 ක් හා රු.369,759 ක් බැව් නිරීක්ෂණය විය. එසේම සෘණ නුබුන්වත් ආන්තිකය පිළිවෙලින් රු.12,740,116 ක් සහ රු.2,164,458 ක් විය. එම කාලය තුල ශුද්ධ වත්කම් හා ප්‍රකාශිත ප්‍රාග්ධනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2015<br>රු | 2014<br>රු |
|---|---|---|
| ජංගම වත්කම් | 5,420,500 | 10,801,514 |
| ජංගම වගකීම් | 15,839,148 | 11,171,273 |
| කාරක ප්‍රාග්ධනය | (10,418,648) | (369,759) |
| ශුද්ධ වත්කම් | (9,740,116) | 835,542 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 3,000,000 | 3,000,000 |
| නුබුන්වත් ආන්තිකය | (12,740,116) | (2,164,458) |